**මුලටියන ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 06 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේදී වෙන්දේසි කරන ලද පිරිවැය රු.2,380,000 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කර නොතිබුණි.

(ආ) නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සභා අරමුදලින් දරා තිබුණු රු.10,180,322 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,209,603 ක දායක මුදල සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.2,229,770 ක් වූ මුද්දර ගාස්තු වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.445,984 ක් හා ස්ථාවර තැන්පතු ශේෂය රු.174,352 ක් වැඩියෙන් ද ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.81,200 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.11,397,835 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම

------------------

2013 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින රු.36,289 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

### 1.3.5 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

------------------------------

ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.3,251,893 ක්වූ අත්තිකාරම් ගිණුමේ ශේෂයද, ස්ථාවර තැන්පත් පොලී ගිණුමේ රු.900,196 ක් වූ ශේෂය, රු.7,290 ක අස්ථානගතවූ මුදල්ද, රු.7,365 ක් වූ එකතු කළ අගය මත බදු සහ රු.112,296 ක් වූ සියයට 5 ක නිශ්චිත ගාස්තු ශේෂද, 2014 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන හිඟ හිටි ආදායම් ශේෂය තුළ ඇතුළත් රු.30,335,734 ක් ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------

එකතුව රු.19,754,624 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛන, හිමිකම් ඔප්පු, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා හා උපලේඛනද, එකතුව රු.46,041,095 ක් වූ වත්කම් පන්ති 03ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තාද , රු.3,317,919 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් ලේඛන සහ උපලේඛනද, රු.53,263,909 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ හා ණයගැති ලේඛනද, එකතු වටිනාකම රු.20,535,208 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් උපලේඛන, ශේෂ සනාථ සහ කාල විශ්ලේෂණද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම්, අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.13,430,062 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.8,851,738 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,578,324 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ මුළු පුනරාවර්තන ආදායම, ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| **වර්ෂය** | **මුළු පුනරාවර්තන ආදායම්** | **ආදායම් ආධාර** | **ස්වයං උත්පාදිත ආදායම්** | **මුළු පුනරාවර්තන වියදම්** | **ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම්** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 44,377,383 | 26,720,460 | 17,656,923 | 30,947,321 | (13,290,398) |
| 2014 | 34,793,334 | 20,527,943 | 14,265,391 | 25,941,595 | (11,676,204) |
| 2013 | 27,163,150 | 11,283,100 | 15,880,050 | 19,937,898 | (4,057,848) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර වල මෙන්ම, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම්වල වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ii) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව සැළකිය යුතු අගයන්ගෙන් වර්ධනය වී තිබුණු නමුත්, එම තත්ත්වය පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවා වර්ෂ තුනෙහිම සැළකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් උද්ගත වී තිබුණු අතර, ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාව නොලැබෙන බව පෙන්නුම් කෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.7,100,968 ක ප්‍රාග්ධන ආධාර ප්‍රමාණය ඉක්මවා රු.10,278,436 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**-----------------------**

**2.3.1 අක්කර බදු**

**-------------**

ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.157,586 ක් හා වර්ෂයේ බිල්කිරීම් රු.21,648 ක් සමඟ රු.179,234 ක් අයවිය යුතුව තිබුණි. ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 7 ක් හා බිල්කිරීම් වලින් සියයට 63 ක් අය වී තිබුණද, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.2 කුලී**

**-----**

ආරම්භක හිඟය වූ රු.461,630 ක ශේෂය සහ රු.2,956,300 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.3,417,930 ක් අයවිය යුතුව තිබුණු අතර, වර්ෂයේ බිල්කිරීම් වලින් සියයට 95 ක් හා හිඟ ශේෂයෙන් සියයට 25 ක් අය කරගෙන තිබුණි.

**2.3.3 කඩ බදු**

**---------**

2008 වර්ෂයේදී බදු ගිවිසුම් අත්සන් කර තිබූ මාකඳුර පොදු වෙළෙඳ සංකීර්ණයේ ඉහළ මහලේ කඩ කාමර 06 ක් 2013 වසරේදී නැවත සභාවට බාරගන්නා තෙක් රු.224,900 ක් වූ බදු මුදලක් සහ රු.443,500 ක් වූ එක්වන් බදු මුදල් අයවී නොතිබුණි.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.115,270 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.8,763,050 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධන ඇගයීම

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී ලැබී තිබුණු රු.7,000,000 ක මුදලින් උපයෝජනය නොකරන ලද රු.1,423,460 ක් 2016 මාර්තු මාසයේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වෙත යවා තිබුණි. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 මැයි 05 දිනැති අංක 1/2014 දරන චක්‍රලේඛයේ අරමුණු වලට පටහැනි කාර්යයන් සඳහා රු. 821,500 ක වියදම් දරා තිබුණි.

(ආ) 2015 වර්ෂය සඳහා ලැබී තිබුණු රු.1,000,000 ක මුදල් වියදම් කිරීමට අදාළ ප්‍රගතිය 2015 නොවැම්බර් මස දක්වා ඉදිරිපත් නොකිරීම නිසා, ඉතිරි රු.6,000,000 ක මුදල රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පසුගිය වසර 06 තුළ සභා බල ප්‍රදේශයේ හඳුනාගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 73 ක් සම්බන්ධයෙන් 1987 අංක 45 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii) (ඉ),(උ) සහ 126 (ix) හි සඳහන් අතුරු ව්‍යවස්ථා ප්‍රකාර කටයුතු කර නොතිබුණු අතර, 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව දඩ මුදල් අයකර නොතිබුණි.

### 3.3 හඳුනාගත් අලාභ

විශේෂ අවශ්‍යතාවයකින් තොරව 2016 ජූලි දින කල් පිරීමට නියමිතව තිබූ රු.2,500,000 ක ස්ථාවර තැන්පතුවක් 2016 මැයි 13 දින මුදල් කර ගැනීම නිසා ලැබිය යුතුව තිබුණු රු.177,055 ක පොලී ආදායම් සභාවට අහිමිවී තිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද කාර්යාල ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා පැතිබැම්මක් ඉදිකිරීමට 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.6,782,281 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීමේදී ඊට අනුකූල වන පරිදි රු.541,026 ක කාර්ය සාධන බැඳුම්කරය දීර්ඝ කරගෙන නොතිබුණි.

(ආ) පැති බැම්ම හා ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකරන භූමිය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ලබාදී තිබූ යෝග්‍යතා සහතිකයේ කාලය ඉකුත්වී තිබුණි. එකී සහතිකයේ කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් පස් කඩා වැටී තිබුණු අතර, ඉදිකරමින් පවතින ගොඩනැගිල්ලේ බිත්ති පුපුරා යාම නිසා ජනෙල් වලටද හානි සිදුවී තිබුණි.

(ඇ) ඉංජිනේරුමය උපදෙස් වලට අනුකූල නොවන අයුරින් භූමියේ පස් කණ්ඩි කපා තිබීම නිසා රු. මිලියන 50 ක වියදමින් ඉදිකරන ලද ගොඩනැගිල්ල අවදානමකට ලක්වී තිබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට හෝ පරිසර බලපත්‍රයක් ලබාගැනීමට හෝ කටයුතු කර නොතිබුණු අතර, බල ප්‍රදේශය තුළ වූ කර්මාන්ත ශාලා 10 ක් විසින් බැහැර කරන කසල වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් ආදායම් විෂයයන් පහක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම රු.735,729 ක් හා වියදම් විෂයයන් අටක එකතුව රු.142,193,872 ක් වූ ඉතිරි කිරීම්ද, පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 වත්කම් කළමනාකරණය**

**නිශ්ක්‍රීය සම්පත්**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රිය පාලනය පිළිබඳ අමාත්‍යාංශය මගින් 2015 වර්ෂයේදී සභාවට ලබාදී තිබූ රු.7,697,142 ක් වටිනා ටොන් 104 කම්පන රෝල කිසිදු ඵලදායී කාර්යයකට යොදවා නොගෙන සභාවට අයත් කොම්පෝස්ට් පොහොර අංගනයේ ගාල්කර තිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය